# කොවිඩ් 19 සති පාසල සබරගමු පළාත.
## නිවිතිගල අධ්‍යාපන කලාපය.
### 9 - ශ්‍රේණිය - - ඉතිහාසය -2021-පළමු වාරය

| | | |
|---|---|---|
| පැවරුම | :- | 04 වන සතිය (2021.01.24 සිට 2021.01.30 දක්වා) |
| ඒකකය 01 | :- | **ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ ලන්දේසි යටතට පත්වීම.** |
| ක්‍රියාකාරකම | :- | **ලන්දේසින් උඩරට රාජධානිය සමග පැවති සබඳතා වල ස්වරූපය සොයා බලමු.** |
| හැඳින්වීම | :- | ලන්දේසින් විසින් උඩරට රාජධානියක් සමග ඉතා සමීපව හා සුහදව කටයුතු කිරීමට යොමුව ඇත. එයට හේතුව නම්, උඩරට ප්‍රදේශයේ පැවැති ආර්ථිකමය වැදගත්කම වේ. ඒතුළ ගැටුම් ඇති කර නොගැනීමට ඔවුන් වගබලා ඇත. ඒබව, උඩරට රාජධානියේ ඇතැම් පාලකයින් හා සම්බන්ධව ඔවුන් දැක්වූ විවිධ ප්‍රතිචාර මගින් හෙළිවේ. එහෙත් ඇතැම් අවස්ථාවල උඩරට අභ්‍යන්තර දේශපාලනික ගැටුම් ඇතිවන අවස්ථා තුළ එම ප්‍රදේශයේ දේශපාලනික බලය තහවුරු කර ගැනීමේ අරමුණින් මොවුන් උඩරට ආක්‍රමණය කිරීමට යොමුවූ අවස්ථා ද වේ. |

| | | | |
|---|---|---|---|
| සිසු උපදෙස් | :- | *පියවර 01* | පෙළ පොතෙහි පිටු අංක 10 සිට 12 දක්වා හොඳින් කියවා ගන්න. |
| | | *පියවර 02* | පසුගිය සතියේ ප්‍රශ්නාවලිය අවසන් වූ තැනින් ඉහතින් දී ඇති හැඳින්වීම සටහන් කර ගන්න. |
| | | *පියවර 03* | පහත දී ඇති ක්‍රියාකාරකමේ නිරතවන්න. (එම කොටසේ සටහන් පොතෙහි සටහන් තබා ගැනීම වැදගත්) |

***ක්‍රියාකාරකම අංක 04***

01) උඩරට රාජධානිය හා ලන්දේසි අතර මිත්‍ර සබඳතා වර්ධනය කර ගැනීමට අනුගමනය කළ ක්‍රියාමාර්ග තුනක් ලියා දක්වන්න.

02) කුණ්ඩකලේ කුමරු නමින් ප්‍රකට වූ උඩරට රජු නම් කරන්න.

03) උඩරට රාජධානිය දකුණු ඉන්දියාවන් සමග වෙළඳ සබඳතා පවත්වා ගත් ප්‍රධාන වරායන් තුනක් දක්වන්න.

04) උඩරට හා ලන්දේසින් අතර මිත්‍රත්වය පළුදු වූ අවස්ථාවක් ලියා දක්වා එහිදී දෙපාර්ශවය ක්‍රියා කළ ආකාරය දක්වන්න.

05) සිංහලයේ අවසාන රජු නම් කරන්න.

06) නායක්කර් වංශික ප්‍රථම රජතුමා කවුරුන් ද?

07) ලන්දේසින්ගෙන් නැව් ලබාගෙන සියම් දේශයෙන් උපසම්පදා භික්ෂූන් ගෙන්වා ගැනීමට කටයුතු කළ රජු කවුරුන් ද?

08) 1753 දී මෙරටට සියම් දේශයෙන් මෙරටට පැමිණි භික්ෂූන් වහන්සේ කවුරුන් ද?

09) ඒ සමග ආරම්භ වූ නිකාය කුමක් ද?

10) 1762 උඩරටට පැමිණි ඉංග්‍රීසි ජාතික දූතයා කවුරුන් ද?

11) 1765 උඩරට ආක්‍රමණය මෙහෙය වූ ලන්දේසි ආණ්ඩුකරු නම් කරන්න.

12) 1766 උඩරට රජු හා ඇතිකරගත් ගිවිසුමේ කොන්දේසි මොනවා ද?

13) එම ගිවිසුමෙන් ලාංකිකයන්ට අත්වූ අවාසි සහගත තත්ත්වයන් දක්වන්න.

සැකසුම :- උදාර අරවින්ද
නිවිතිගල කලාප කාර්යාලය
ර/කලවාන ජාතික පාසල